NPAIRC 2026
International Research Conference
National Police Academy
Sri Lanka

**ඡායාරූප සාරාංශ / කතාන්දර ඉදිරිපත් කිරීම් සඳහා වන උපදෙස්**

1. ඔබේ ඉදිරිපත් කිරීම සඳහා වෙන්කර ඇති කාලය මිනිත්තු 12 කි. ඉන්පසුව මිනිත්තු 3 ක ප්‍රශ්න සහ පිළිතුරු සැසියක් පැවැත්වේ (ට්‍රැක් [Track] අනුව ඉදිරිපත් කිරීමේ කාල සීමාවන් වෙනස් විය හැක).

2. ඉදිරිපත් කිරීම ඉංග්‍රීසි හෝ සිංහල භාෂාවෙන් තිබිය යුතු බව කරුණාවෙන් සලකන්න.

3. තාර්කික ආරම්භයක්, වර්ධනයක් සහ නිගමනයක් සහිතව, **ඉදිරිපත් කිරීම පැහැදිලි, සිත්ගන්නාසුලු සහ ශ්‍රාවකයන්ට පහසුවෙන් තේරුම් ගත හැකි එකක් වන** බව ඉදිරිපත් කරන්නන් තහවුරු කළ යුතුය.

4. විශේෂයෙන්ම යම් පුද්ගලයන් හෝ අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සම්බන්ධ වන කතාන්දර භාවිතා කිරීමේදී, **ආචාරධර්මීය කරුණු, පෞද්ගලිකත්වය, ගෞරවය සහ රහස්‍යභාවය පිළිබඳව** ඉදිරිපත් කරන්නන් සැලකිලිමත් විය යුතුය.

**සාමාන්‍ය උපදෙස්**

1. සැසිය ආරම්භ වීමට නියමිත වේලාවට මිනිත්තු 15 කට පෙර ඔබ අදාළ ස්ථානයට පැමිණ සිටිය යුතුය. ඔබේ ඉදිරිපත් කිරීම සඳහා වන කාලසටහන සහ ස්ථානය ජාතික පොලිස් ඇකඩමි (National Police Academy) වෙබ් අඩවියේ ඇති වැඩසටහන් පොතෙන් සොයාගත හැක. ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්, කරුණාකර අදාළ ට්‍රැක් සම-සභාපති (Track Co-chair) සම්බන්ධ කර ගන්න.

2. සෑම සැසියක් අවසානයේදීම අදාළ සැසිය සඳහා **හොඳම ඉදිරිපත් කරන්නා (Best Presenter)** තෝරාගනු ලැබේ. සියලුම ඉදිරිපත් කිරීම් අදාළ ට්‍රැක් මගින් නිර්දේශිත නිර්ණායකයක් භාවිතයෙන් විනිශ්චය මණ්ඩලයක් විසින් ඇගයීමට ලක් කරනු ඇත. විනිසුරුවන්ගේ තීරණය අවසාන තීරණය වන අතර, ඒ පිළිබඳව කිසිදු පැහැදිලි කිරීමක් කරනු නොලැබේ.

3. ඉදිරිපත් කිරීම පැහැදිලි, සංක්ෂිප්ත සහ ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකාවට/සාරාංශයට (abstract) ඍජුවම අදාළ විය යුතුය.

4. ඉදිරිපත් කරන්නන් තමන්ට වෙන් කර ඇති ඉදිරිපත් කිරීමේ කාලයට තදින්ම අනුගත විය යුතුය. ඉදිරිපත් කිරීම වෙන් කළ කාලය ඉක්මවා ගියහොත් සැසි සභාපතිවරයාට (session chair) ඊට මැදිහත් විය හැක.